# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## සෙරෙට්සෙ ඛාමා පදනම් භාරය
## (සංස්ථාගත කිරීමේ)

**සෙරෙට්සෙ ඛාමා පදනම් භාරය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

මාතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු බුද්ධික පතිරණ මහතා විසින්
2015 දෙසැම්බර් මස 08 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2015 නොවැම්බර් මස 09 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[39 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 8.00 යි** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

2—PL 009525—225 (2015/12)

## සෙරෙට්සෙ බාමා පදනම් භාරය
## (සංස්ථාගත කිරීමේ)

**සෙරෙට්සෙ බාමා පදනම් භාරය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

සෙරෙට්සේ බාමා පදනම් භාරය යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන භාරයක්, එකී භාරයට සම්බන්ධ සියලු කාරණා හා පරමාර්ථ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද :

එකී භාරය 2006 ජනවාරි මස 20 වන දින ඇති කරන ලද්දේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ සහ කරුණු එකී භාරයේ භාරකාර මණ්ඩලය විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද, ඒ භාරකාර මණ්ඩලය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් සහ ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2015 අංක දරන සෙරෙට්සෙ බාමා පදනම් භාරය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

සෙරෙට්සෙ බාමා පදනම් භාරය සංස්ථාගත කිරීම.

**2.** මෙහි මින් මතු ''පදනම් භාරය'' යනුවෙන් සඳහන් කරනු ලබන සෙරෙට්සෙ බාමා පදනම් භාරයේ භාරකාර මණ්ඩලයේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් සහ මේ පනතේ උපලේඛනයේ ස්වකීය නම් දක්වා ඇති තැනැත්තන් හෝ භාරකාර මණ්ඩලයේ මින් මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කරගනු ලබන තැනැත්තන් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන්පසු සෙරෙට්සෙ බාමා පදනම් භාරය යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු ''සංස්ථාව'' යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් වන අතර, භාරයේ භාරකාර මණ්ඩලය නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි ය. තව ද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේ ය.

2—PL 009314 -300 (2015/10)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව ඇති කරන ලද්දේ යම් පොදු පරමාර්ථ උදෙසා ද ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) බොස්ට්වානා හි ප්‍රථම ජනාධිපති ශ්‍රීමත් සෙරෙට්සෙ ඛාමා මැතිතුමා නිරන්තරයෙන් අනුස්මරණය කිරීම සහ සාමය සහ එකීය භාවය පිළිබඳ එතුමාගේ පණිවුඩය ශ්‍රී ලංකාව තුළ පතුරුවා හැරීම ;

(ආ) සංස්කෘතික, සාමාජීය සහ ආර්ථික හුවමාරුව ප්‍රවර්ධනය කරමින් ශ්‍රී ලංකාව සහ බොස්ට්වානා යන රටවල් දෙක අතර ද්විපාර්ශ්වික සබඳතාව වර්ධනය කිරීම ;

(ඇ) දිළිඳු සහන සේවාවන්හි සහ දරිද්‍රතාව පිටුදැකීමේ කාර්යයන් යෙදීම ;

(ඈ) බොස්ට්වානා විශ්වවිද්‍යාලයේ සහ කොළඹ විශ්වවිද්‍යාලයේ සුදුසු ශිෂ්‍යයන්ට මුදල් ආධාර ලබා දීම සහ ශිෂ්‍යත්ව සහ ශිෂ්‍යාධාර පිරිනැමීම ;

(ඉ) ස්වාභාවික ව්‍යවසනයන් පවත්නා අවස්ථාවන් හිදී ආධාර සහ සහන සේවා සැපයීම ;

(ඊ) ජනතාව අතර පවත්නා සියලුම විෂමතාවන් පිටුදැකීම සහ නීතියේ ආධිපත්‍යය පවත්වා ගෙන යාම සඳහා කටයුතු කිරීම ;

(උ) තම ජීවිත නගා සිටුවා ගැනීම සඳහා ස්ත්‍රීන්ට සහ ළමුන්ට උපකාර කිරීම ;

(ඌ) තරුණයන් සඳහා නේවාසිකාගාර, වෛද්‍ය මධ්‍යස්ථාන සහ නිවාස පිහිටුවා පවත්වාගෙන යාම;

(එ) දැණුම පතුරුවා හැරීම සඳහා ජාත්‍යන්තර අන්තර්ජාල සහ ගුවන් විදුලි මධ්‍යස්ථාන පිහිටුවීම ;

(ඒ) ජනතාවගේ ජීවන තත්ත්වය නාගා සිටුවීමේ ලා රජය විසින් ගනු ලබන ප්‍රයත්නයට සහාය වීම ;

(ඔ) ආපදා සහන කටයුතුවල සහ ප්‍රතිසංස්කරණ කටයුතුවල නියැලීම ;

(ඕ) ජනතාවගේ සුභසාධණය සඳහා වෛද්‍ය ආධාර සහ නීති ආධාර සංස්ථාපනය කිරීම ; සහ

(ක) සංස්ථාවේ පරමාර්ථයන් මුදුන් පත් කර ගැනීම සඳහා අවශ්‍ය හිතකර හෝ ආනුෂංගික වන වෙනත් ක්‍රියා කිරීම.

භාරකාර මණ්ඩලයේ සංයුතිය.

**4.** (1) භාරකාර මණ්ඩලය අවම වශයෙන් තුන් දෙනෙකුගෙන් හා උපරිම වශයෙන් හත් දෙනෙකුගෙන් සමන්විත විය යුතු ය. මින් පස් දෙනෙකු සංස්ථාවේ රීති අනුව පත් කරනු ලබන අතර, අනෙකුත් තැනැත්තන් අවශ්‍ය යයි හැගුණ විට භාරකාර මණ්ඩලය විසින් පත් කරනු ලැබේ.

(2) චූලපත්මේන්ද්‍ර දහනායක මහතා යාවජීව භාරකරු වන අතර, මෙම පනතේ ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට අවුරුදු පහක කාලයක් සඳහා භාරකාර මණ්ඩලයේ සභාපතිවරයා ද වන්නේ ය.

(3) අනෙකුත් භාරකරුවන් මෙම පනත ආරම්භ වන දින සිට අවුරුදු පහක කාලයක් සඳහා නිල දරන්නේය.

(4) භාරකාර මණ්ඩලය විසින් පත් කළ හැකි ඕනෑම භාරකරුවකු, භාරකාර මණ්ඩලයේ අභිමතය අනුව අවුරුදු පහක කාලයක් හෝ ඊට අඩු කාලයක් නිලය දරන්නේ ය.

(5) චූලපත්මේන්ද්‍ර දහනායක මහතා මිය ගිය හොත් තමන් අතුරින් කෙනෙකු සභාපති වශයෙන් පත් කිරීමට හෝ මෙම පනතේ විධිවිධාන අනුව අලුතින් කෙනෙකු පත් කිරීමේ අයිතිය අනෙකුත් භාරකරුවන්ට ඇත.

(6) භාරකරුවන් කිසිවකු හෝ භාරකරුවකු තම තනතුරෙන් විශ්‍රාම ලබන්නේ නම් හෝ කටයුතු කිරීමට නුසුදුසු තත්ත්වයකට පත් වන්නේ නම්, නැතහොත් කටයුතු කිරීම ප්‍රතික්ෂේප කරන්නේ නම් හෝ ඉල්ලා අස් වන්නේ නම් හෝ නැතහොත් කුමන හෝ භාරකරුවකු මිය යන්නේ නම් අනුප්‍රාප්තික භාරකරුවකු වහාම පත් කර ගැනීමට එවකට සිටින භාරකරුවන්ට අයිතිය ඇත. කෙසේ වෙතත්, එම අනුප්‍රාප්තික භාරකරු භාර අර්ථදායකයාගේ කැමැත්ත මත පත් කර ගත යුත්තේ ය.

(5) භාරකරුවකු, භාරකරුවන් 2/3 කගේ බහුතර ඡන්දයෙන් සහ අර්ථදායකයාගේ අනුමැතිය යටතේ ඉවත් කළ හැකි ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**5.** (1) මෙම පනතේ සහ වෙනත් ලිඛිත නීතියක විධිවිධානවලට හා භාරයේ නියමවලට යටත් ව භාරයේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ හිතකර හෝ ආනුෂංගික හෝ සියලු ක්‍රියා සහ දේ කිරීමේ බලය සංස්ථාවට ඇත.

(2) (1) වන උපවගන්තියේ පවරා දී ඇති බලතලවලට හානියක් නොමැතිව, පහත සඳහන් බලතල සංස්ථාවට ඇත්තේ ය:—

(අ) යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක් හෝ රික්තවරණය කිරීමක් මගින් හෝ අන්‍ය කවරාකාරයකින් වුව ද සංස්ථාව වෙත සතු වන යම් නිශ්චල හෝ චංචල දේපලක් අත්කර ගැනීම සහ දැරීම ;

(ආ) එවැනි යම් දේපලක් විකිණීම, උකස් කිරීම, බදු දීම, පවරා දීම, රික්තවරණය කිරීම, පැවරීම, හුවමාරු කිරීම හෝ වෙනත් ආකාරයකින් නියාදනය කිරීම ;

(ඇ) භාරයට අයත් අරමුදල සංස්ථාව විසින් තීරණය කරනු ලැබිය හැකි භාණ්ඩාගාර බැඳුම්කරවල භාණ්ඩාගාර බිල්පත් වල හා වෙනත් යම් සුරැකුම්පත්වල ආයෝජනය කිරීම ;

(ඈ) බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වා ගෙන යාම සහ වැසීම සහ ඇප ඇතිව හෝ ඇප නොමැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම ;

(ඉ) භාරයේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම, සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීම සේවයේ නියුක්ත කිරීම සහ සේවයෙන් පහ කිරීම ;

(ඊ) මුදල් එකතු කිරීම සහ මුදලින් නැතහොත් ද්‍රව්‍යවලින් ප්‍රදාන හෝ ත්‍යාග හෝ පරිත්‍යාග භාර ගැනීම ;

(උ) භාරයේ කටයුතු පාලනය කිරීම සහ එහි වත්කම් කළමනාකරණය කිරීම ;

(ඌ) භාරයේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා රජය සහ වෙනත් ආයතන සහ බැංකු සමග සම්භාෂණයේ යෙදීම ;

(එ) කුමන මුදල් ප්‍රාග්ධනය ලෙස සහ කුමන මුදලක් ආදායම් ලෙස සලකන්නේ දැයි තීරණය කිරීම ;

(ඒ) කුමන වියදමක් පිරිවැයක් සහ වැය කිරීමක් නියම අන්දමින් ප්‍රාග්ධනයෙන් හෝ ආදායමෙන් වැය කළ යුතු දැයි තීරණය කිරීම ;

(ඔ) සංචාරක නිකේතන පිහිටුවීම සහ සංචාරක කැබ් රථ සැපයීම, භාරයේ පරමාර්ථ ඇතුළත නව ආයෝජන කටයුතු වල යෙදීම සහ ප්‍රතිපත්ති පහදා දීම ඒවා ක්‍රියාත්මක කිරීම ;

(ඕ) ගොවි පොළවල් සහ කෘෂිකාර්මික දේපල මිලදී ගැනීම ;

(ක) භාරයේ පරමාර්ථ මුදුන් පත් කර ගැනීම සඳහා අවශ්‍ය හිතකර හෝ ආනුෂංගික වන වෙනත් සියලු ක්‍රියා සහ දේ කිරීම.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාව විසින් කලින් කල සාමාජිකයන්ගෙන් යම් සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට සහ භාරයේ නියමයන් ට අනනුකූල නොවන රීති පහත සඳහන් කාරණා සියල්ල ම සම්බන්ධයෙන් හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් සාදනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය. :—

(අ) ශිෂ්‍යත්ව ප්‍රදාන කිරීම සහ මුදල් ආධාර දීම;

(ආ) සංස්ථාවේ රැස්වීම්වල කටයුතු කිරීමේ දී අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය ;

(ඇ) සංස්ථාවේ සාමාජිකයන්ගේ සහ විවිධ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ බලතල, හැසිරීම් හා කාර්ය සහ කර්තව්‍ය ;

(ඈ) භාරයේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා සංස්ථාව විසින් දරනු ලබන වියදම් පියවීම ;

(ඉ) භාරයේ දේපල පරිපාලනය සහ කළමනාකරණය, එහි අරමුදල් භාරකාරත්වය සහ එහි ගිණුම් පවත්වාගෙන යාම විගණනය කිරීම ; සහ

(ඊ) භාරයේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය වෙනත් සියලු දේ.

(2) සංස්ථාව විසින් සාදනු ලබන යම් රීතියක් (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලබන ආකාරයෙන් එවැනිම රැස්වීමක දී වෙනස් කිරීම, එය සංශෝධනය කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත් විය යුතු ය.

භාරකාර මණ්ඩලයේ රැස්වීම්.

**7.** (1) භාරකාර මණ්ඩලය යටත් පිරිසෙයින් අවුරුද්දකට එක් වරක් හෝ රැස්විය යුතු ය.

(2) භාරකාර මණ්ඩලයේ සභාපතිවරයා විසින් සියලුම භාරකරුවන්ට දින පහක දැනුම් දීමක් කිරීමෙන් අනතුරුව විශේෂ මහා සභා රැස්වීම් කැඳවිය හැකි ය.

(3) ගණපූරණය භාරකරුවන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු ය.

(4) සෑම රැස්වීමකම කාර්ය සටහන් ඊලඟ රැස්වීමේ දී කියවා සංශෝධන ඇතිව හෝ නොමැතිව සම්මත කර ගත යුතු ය.

(5) භාරකාර මණ්ඩලයේ රැස්වීම් ශ්‍රී ලංකාවේ දී හෝ බොස්ට්වානාවලදී පැවැත්විය හැකි ය.

සංස්ථාවේ අරමුදල.

**8.** සංස්ථාවේ අරමුදල —

(අ) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වීමට පෙරාතුව ම වූ දිනයේ දී භාරයේ බැරට තිබුණු සියලු මුදල්වලින් ; සහ

(ආ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයෙන් පසු සංස්ථාවට එකතු වන සියලු මුදල්වලින් සමන්විත විය යුතු ය.

(ඇ) සංස්ථාවේ මුදල් වර්ෂය සෑම වසරකම අප්‍රේල් 01 වන දායින් පටන් ගෙන මාර්තු 31 වන දිනෙන් අවසන් විය යුතු ය.

**ගිණුම් සහ විගණනය.**

**9.** (1) සංස්ථාවේ සියලු ආදායම් හා වියදම් පිළිබඳ නිසි ගිණුම් තැබීමට සංස්ථාව විසින් කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම් සංස්ථාව විසින් පත් කරනු ලබන විගණකවරයන් විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු ය.

**භාරය විසින් ගෙවිය යුතු සහ භාරයට ලැබිය යුතු ණය.**

**10.** මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි භාරයේ පැවති සියලු ණය සහ බැරකම් මෙයින් පිහිටුවනු ලැබූ සංස්ථාව විසින් ගෙවා නිදහස් කරනු ලැබිය යුතු අතර, එදිනට භාරයට අය විය යුතු සියලු ණය සහ දායක මුදල් සහ සම්මාදම් මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

**සංස්ථාවේ මුද්‍රාව.**

**11.** සංස්ථාවේ මුද්‍රාව සංස්ථාව භාරයේ තිබිය යුතු අතර, සංස්ථාවේ අනුමැතිය ඇතිව සහ සංස්ථාවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස එය කවර වූ සාධණ පත්‍රයකට නොතැබිය යුතු ය. තව ද තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එකී සාමාජිකයන් විසින් එම සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු අතර, එවැනි අත්සන් කිරීමක් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සනකට පරිබාහිරව විය යුතු ය.

**ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.**

**12.** මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන වෙනත් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.**

**13.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

භාරකාර මණ්ඩලය (2 වන වගන්තිය)

1. චූලපත්මේන්ද්‍ර දහනායක
2. අර්ල් ලක්ෂ්මන් ජයවර්ධන
3. ධම්මික කිතුල්ගොඩ
4. ජයන්ත ඩබ්ලිව්. ඒ. සෙනෙවිරත්න
5. ඉන්ද්‍රා හේමලතා දහනායක මහත්මිය
6. මොහොමඩ් උවයිස් මොහොමඩ් තාරික්
7. පලනිනාදන් විජිතන්

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.